75

25

# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

Ministry of Finance, Economic Stabilaization & National Policies

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.03. |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>සුබසාධක ප්‍රතිලාභ දීමනා ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම - 2022 තේරීම් කමිටුවල කාර්යභාරය</u>

2002 අංක 24 දරණ පනතේ විධිවිධානයන්ට අනුව ඔබ හා ඔබේ කණ්ඩායමේ කැපවීම හා කරුණාව දීම මත ඒකාබද්ධ ඉලෙක්ට්‍රොනික සුබසාධක කළමනාකරණ පද්ධතියක් රට තුළ ගොඩ නැගෙමින් පවතින අතර තේරීම් කමිටුවේ කටයුතු සඳහා තොරතුරු පද්ධතිය සූදානමින් සිටින බව ඒ වෙනුවෙන් ඔබ ලබා දුන් සහායට ස්තූති පූර්වකව දන්වා සිටිමි.

02. සුබසාධක ප්‍රතිලාභ පනතේ 15 වන වගන්තියෙන් කියවෙන පනතේ විධිවිධානයන්ට අනුකූලව හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගවලට අනුකූලව තේරීම් කමිටු විසින් සිය කාර්යයන් කරගෙන යන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය බලය ඔබ වෙත ලබා දී තිබේ. සුබසාධක ප්‍රතිලාභ පනතේ 10 වගන්තිය අනුව පනවා ඇති හා පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති 2022 අංක 1 දරණ සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ (ගෙවීම් ලැබීම පිණිස සුදුසු තැනැත්තන් තෝරා ගැනීම) නියෝග මගින් ද තේරීම් කමිටුවල කාර්යභාරය පැහැදිලි කර තිබේ.

ඒ මෙසේය,

පනතේ 7 වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති (අස්වැසුම ජංගම මෘදුකාංගයට අනුව සංගණන නිළධාරීන් විසින් රැස් කර ඇති) ප්‍රකාශනවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සහ නිශ්චය කර ගැනීම තේරීම් කමිටුවල කාර්යභාරය වේ.


තවද පනතේ 10 (3) වගන්තියෙන් හා පනවා ඇති නියෝගයන් එක්ව ගත් කළ මෙසේද කියවේ.

තේරීම් කමිටුව වෙත ඉදිරිපත් කර ඇති ප්‍රකාශන විමසා බැලීමෙන් පසුව සහ එය විසින් අවශ්‍ය යැයි සලකන්නා වූ යම් විමසීම් සිදු කරනු ලැබීමෙන් පසු සුබසාධක ප්‍රතිලාභ ලැබීම පිණිස ඔවුන්ගේ මතය අනුව සුදුසුකම් ලබා තිබෙන (සුදුසුකම් ලබා තිබේද යන්න පරිගණකයට ඇතුළත් කොට ඇති පරීක්ෂා කිරීමේ ක්‍රියාවලියක් හා සූත්‍ර ඇසුරින් සිදු කරනු ලැබේ) තැනැත්තන්ගේ නම් ලැයිස්තුව සිය නිර්දේශය හා ප්‍රාදේශීය ලේකම්ගේ පිටසන සමග සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට (ඒකාබද්ධ සුබසාධක කළමණාකරන පද්ධතියට) ඉදිරිපත් කළ යුතුය.


තේරීම් කමිටුව විසින් පහත සඳහන් පියවරයන් අනුගමනය කළ යුතුය.

i. තේරීම් කමිටුවේ සාමාජිකයින් එකට එක්වී එහි කටයුතු ආරම්භ කළ යුතුය.


ii. ඒ අනුව තේරීම් කමිටු සභාපති/ දෙවන සාමාජිකයා විසින් දත්ත පද්ධතියට ප්‍රවේශ විය යුතුය.



iii. එවිට එම කමිටුවට කටයුතු කිරීමට ඇති සංගණන තොරතුරු පද්ධතිගත වී ඇති පවුල් සංඛ්‍යාව ඒ පවුල්වල විස්තර විද්‍යාමාන වේ.



iv. ඉන් අනතුරුව එක් එක් තැනැත්තන්ට/පවුලට අදාළ දත්ත විස්තර විවෘත කර ගත යුතුය.




v. එම පවුල/තැනැත්තාට අදාළව ඉදිරිපත් කර ඇති දත්ත වල නිරවද්‍යතාව සොයා බැලිය යුතුය.

vi. එම දත්ත නිවැරදි සේ සලකන්නේ නම් අනුමත කිරීමට ඇති බොත්තම (button) ක්‍රියාත්මක කළ යුතුය.

vii. එම දත්ත සංශෝධනය විය යුතු යැයි අදහස් කරන්නේ නම් නැවත සංගණනය (re enumeration) කළ යුතු බවට වූ බොත්තම (button) ක්‍රියාත්මක කළ යුතුය.

viii. එසේ නැවත සමීක්ෂණය කළ යුතු වන්නේ කුමන හේතුවක් මත ද යන්න නිරීක්ෂණ කොටුවේ සඳහන් කළ යුතුය.

ix. මීට අමතරව අයදුම්කරු මියගොස් ඇති අවස්ථාවක, පවුල් ඒකකය එකක් සේ ගත යුතු අවස්ථාවක අනෙකුත් අතුරු පවුල් ඉවත් කිරීම වැනි ඉදිරිපත් වී ඇති කරුණු හා නිරීක්ෂණය කළ හැකි කරුණු අනුව අවස්ථානුකූලව අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ද අවස්ථාවන් සලසා දී තිබේ. එවැනි ප්‍රතික්ෂේප කිරීමට අදාළ බොත්තම (button) ක්‍රියාත්මක කළ යුතුය. මෙසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් එසේ ප්‍රතික්ෂේප කරන්නේ කුමන හේතුවක් මත ද යන්න අදාළ කොටුවේ සටහන් කළ යුතුය. මේ අයුරින් සංගණනය කර ඇති සියළු පවුල්/තැනැත්තන් තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතුය.




x. මීළඟ පියවර වන්නේ මෙසේ තහවුරු කර ගත් සියළු පවුල් තැනැත්තන්ගේ ලේඛනයක් මුද්‍රණය කර ගැනීමයි.

xi. එම ලේඛණයට තේරීම් කමිටු සභාපති / දෙවන සාමාජිකයා හා තුන්වන සාමාජිකයා (සංගණන නිළධාරියා) විසින් වෙනත් නිරීක්ෂණ නොමැතිව එකඟ වන්නේ නම් එම සාමාජිකයන් තිදෙනාගේම අත්සන් ලබා ගැනීම වේ.

xii. මෙම ලේඛනය ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය ලේකම්වරයා එහි නිරවද්‍යතාවය ගැන සෑහීමට පත්වන්නේ නම් දත්ත පද්ධතියට ප්‍රවේශ වී ඉහත ලේඛනයට අදාළ දත්ත ඒ හා බැඳුණු ක්‍රියාවලියට අදාළ කමිටුව විසින් ගෙන ඇති තීරණ නිවැරදි බවට අදාළ බොත්තම (Button) ක්‍රියාත්මක කළ යුතුය.

බී.විජයරත්න
සභාපති / කොමසාරිස්

පිටපත - සියළුම දිසාපතිවරුන් වෙත - කරු. දැ.ගැ.ස.



කාර්යාලය / அலுவலகம் / Office — Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail — welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website — www.wbb.gov.lk